**උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 13/2018**

මගේ අංකය NP/07/10/02/7124
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු පළාත,
යාපනය.
04.04.2018

**ලේකම් ප්‍රධාන අමාත්‍යවර අමාත්‍යාංශය,**
පළාත් ඉඩම් කොමසාරිස්,
උතුරු පළාත.

**උතුරු පළාත් රාජ්‍ය සේවයේ ඉඩම් පරිපාලන දෙපාර්තමේන්තු ක්ෂේත්‍ර උපදේශක තනතුරේ III වන ශ්‍රේණියට අයත් නිලධාරීන් සඳහා වන 1 වැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය – 2017 (II) (2018)**

උතුරු පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද 01.01.2013 දින සිට බල පැවැත්වෙන උතුරු පළාත් රාජ්‍ය සේවයේ ඉඩම් පරිපාලන දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර සේවයේ උපදේශක තනතුර සඳහා වන සේවා ව්‍යවස්ථාවේ 10 වන ඡේදයේ විධිවිධාන හා ඇමුණුම II හි ඇති විධිවිධානයන්ට අනුව ඉඩම් පරිපාලන දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර සේවයේ උපදේශක තනතුරේ III වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2018 මැයි/ජූනි මස යාපනයේ දී පැවැත්වීමට නියමිත බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

2.0 **සුදුසුකම්** :-

- III වැනි ශ්‍රේණියේ නිලධාරීන් පමණක් මෙම විභාගයට අයදුම් කිරීමට සුදුසුකම් ලබති.
- තවද මේ දක්වා මෙම විභාගය සම්පූර්ණ කර නොමැති III ශ්‍රේණියේ නිලධාරීන්ද මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබති.

3.0 අයදුම්පත්‍රය

- අයදුම්පත්‍රය මෙම චක්‍රලේඛය සමඟ අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතුය. එම ආදර්ශ අයදුම්පත්‍රයට අනුව අපේක්ෂකයින් තම අයදුම්පත් පිළියෙල කරගත යුතු අතර, ඒ අනුව පිළියෙළ කරන ලද අයදුම්පත් අපේක්ෂකයින් විසින් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් **2018.04.25** වන දින හෝ ඊට පෙර ලැබෙන සේ **ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත, අංක 393/48, කෝවිල් වීදිය, යාපනය** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.
- අයදුම්පත් බහාලන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"උතුරු පළාත් රාජ්‍ය සේවයේ ඉඩම් පරිපාලන දෙපාර්තමේන්තු ක්ෂේත්‍ර සේවා උපදේශක තනතුරේ III වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන 1 වැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2017 (II) (2018)"** යනුවෙන් සඳහන් කළ යුතුය. අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් හා අවශ්‍ය තොරතුරු සම්පූර්ණ කර නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**4.0 අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය** :- අපේක්ෂකයන් තමන් පෙනී සිටින සියළුම විෂයන්ට විභාග ශාලාධිපති සෑහීමකට පත් වන පරිදි තම අනන්‍යතාව ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් ලියකියවිලි වලින් එකක් හෝ විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත.
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය. (pass port)

ඉහත ලියකියවිලි වලින් කුමක් හෝ ලියකියවිල්ලක් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අයදුම්කරුවෙකුගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය.

5.0 **අයදුම්පත්‍රය** :-

- අංක 1.0 සිට 7.0 දක්වා ඡේදයන් පළමුවන පිටුවටද අනෙකුත් තොරතුරු දෙවන පිටුවටද ඇතුළත් වන පරිදි 'ඒ 4' ප්‍රමාණයේ කඩදාසියක අයදුම්පත්‍රය පිළියෙළ කළ යුතුය. අයදුම්පත්‍රය පරිගණකය මගින් පිළියෙල කර ගත හැකි අතර එය නිවැරදිව හා පැහැදිලිව අයදුම්කරුගේ අත් අකුරින්ම පිරවිය යුතුය.
- අයදුම්පත් මේ සමඟ ඇති ආදර්ශ ආකෘතිය පරිදිම සකස් කර ගත යුතු අතර, අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් හෝ වෙනත් පිටපත් ඉදිරිපත් නොකරන ලෙස මෙමගින් උපදෙස් දෙනු ලැබේ.
- ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන සහ අසම්පූර්ණ තොරතුරු සඳහන් අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

- විභාග දැන්වීමේ සඳහන් පරිදි ඉදිරිපත් කරන අයදුම්පත් ආදර්ශ අකෘති පත්‍රය පරිදිම සකස් කිරීම සම්බන්ධයෙන් අපේක්ෂකයා තම අවධානය යොමු කළ යුතු අතර එම ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් තමන් ළග තබා ගැනිම වලදායි වනු ඇත.

6.0 **විභාග ගාස්තු :-**

6.1 පළමුවරට මෙම විභාගයට පෙනී සිටින නිලධාරින් කිසිදු විභාග ගාස්තුවක් ගෙවීම අවශ්‍ය නොවේ.

6.2 කෙසේ වුවද, ඉන්පසු විභාගයට ඉදිරිපත් වන සෑම වාරයකදීම නිලධාරින් විසින් එක් විෂයකට රුපියල් 200.00 ක් වටිනා මුදල් ඇණවුමක් උතුරු පළාතේ පිහිටි කුමණ හෝ තැපැල් කාර්යාලයකින් ලබාගත හැකිය.

6.3 මුදල් ඇණවුම **ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත යන නමින් යාපනය තැපැල් කාර්යාලයෙන් මාරු කරගත හැකි පරිදි** ලබාගත යුතුය.

6.4 අයදුම්කරු විසින් මුදල් ඇණවුමේ ඡායා පිටපතක් තම ප්‍රයෝජනය සඳහා තමා සතුව තබාගත යුතුයි. කුමන හේතුවක් නිසා හෝ මෙම ගාස්තු නැවත ආපසු ගෙවනු නොලබන අතර එම ගාස්තු වෙනත් විභාග සඳහා ද යොදාගත නොහැකි බව ද දන්වා සිටිමි.

7.0 **විභාගය සඳහා අනුමැතිය :-** අපේක්ෂකයෙකුට විභාගය සඳහා ප්‍රවේශ පත්‍රය නිකුත් කිරීම මත එම නිලධාරියා හෝ නිලධාරිණිය විභාගයට පෙනී සිටීමේ සුදුසුකම් ලබා ඇති බවට සහතිකයක් නොවන අතර විභාගයට පෙනී සිටින නිලධාරියා හෝ නිලධාරිණිය විභාග අධීක්ෂණ නිලධාරී වෙත තම අත්සන සහතික කරන ලද ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුයි එවැනි අත්සන සහතික කරන ලද විභාග ප්‍රවේශ පත්‍රයක් නොමැතිව විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ. කිසියම් අපේක්ෂකයකුට විභාගයට දින 03 ට ප්‍රථම ප්‍රවේශපත්‍ර ලැබුණේ නැතිනම් ඔහු **පහත සඳහන් තොරතුරු සමඟ උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්තුමාට** දැන්විය යුතුය.

- අයදුම් ලිපිය
- ඉල්ලුම් පත්‍රයේ පිටපත
- මුදල් අණුවුමේ සහතික කල පිටපත
- අයදුම්පත තැපැල් කළ තැපැල් කාර්යාලය, ලියාපදිංචි තැපැල් අංකය හා දිනය
- ප්‍රවේශ පත්‍රය එවිය යුතු ෆැක්ස් අංකයක් (Fax No)

8.0 මෙම විභාගයට අදාළ ප්‍රවේශ පත්‍ර ලැබී ඇති නිලධාරින්ට විභාගයට පෙනී සිටීමට හැකිවන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් රාජකාරි නිවාඩු අනුමත කළ යුතුයි. ප්‍රවාහන ගාස්තු ගෙවනු නොලැබේ.

9.0 නිලධාරින් මෙම විභාගයෙන් සමත් වීම සඳහා එක් එක් විෂයකටම අදාළ සමස්ථ ලකුණු ප්‍රමාණයෙන් 40% කට නොඅඩු ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතු ය.

10.0 මෙම විභාගයට අයදුම්කළ සියළුම අයදුම්කරුවන්ගේ විභාග ප්‍රතිඵල උතුරු පළාත් රාජය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් නිකුත් කරනු ලැබේ.

11.0 **විෂය මාලාව**

**ඉඩම් සංවර්ධන නියෝග පනත　　　විෂය අංක (01) පැය 03 යි　　ලකුණු 100**

**I. ඉඩම් සංවර්ධන නියෝග පනත**

**අ. සිතියම්කරණය**
**ආ. ඉඩම් කච්චේරි ක්‍රියාපටිපාටි**
**ඉ. නිර්දේශ**
**ඊ. අඛණ්ඩව රඳවා ගැනීම**
**උ. බලපත්‍ර /කුලී අහෝසි කිරීම**

**II. රාජ්‍ය ඉඩම් ආඥා පනත**

**අ. ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රමය**
**ආ. වාර්ෂික කුලිය අය කර ගැනීම**
**ඉ. ලේඛණ අවළංගු කිරීම**

**III. ඉඩම් නැවත සන්තක කර ගැනීම සඳහා වන පනත**

**රජයේ ඉඩම් නැවත සන්තක කර ගැනීමේ පටිපාටිය**

12.0 මෙම චක්‍රලේඛයේ සඳහන් තොරතුරු ඔබ අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු/කාර්යාල යටතේ සේවයේ නියුතු අදාළ නිලධාරීන් දැනුවත් කිරීමට අවශ්‍ය කටයුතු සලසන ලෙසට කාරුණිකව දැනුම් දෙනු ලැබේ.

**සටහන :- මෙම චක්‍රලේඛයේ සඳහන් භාෂා මාධ්‍යයේ යම්කිසි වෙනසක් දක්නට ලැබේ නම් මෙවැනි අවස්ථාවල දී දෙමළ මාධ්‍යය ප්‍රමුඛත්වය දරණ බවට දන්වා සිටින අතර මෙම විභාග දැන්වීම මගින් ප්‍රතිපාදන සලසා ඇති හෝ නොමැති කරුණු සම්බන්ධයෙන් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයාගේ තීරණය අවසන් තීරණයවනු ඇත.**

**සී.ඒ. මෝහන්රාස්,**
**ලේකම්,**
**පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,**
**උතුරු පළාත.**

**පිටපත : ප්‍රධාන ලේකම්, ප්‍රධාන ලේකම් කාර්යාලය, උතුරු පළාත. - කා.දැ.ගැ.ස.**